# ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණේ ව්‍යවස්ථාව

(ප්‍රතිපත්ති ප්‍රකාශනය අන්තර්ගත වූ පරිදි)

ආරම්භය

2532/1988 12. 29


කාර්යාලය
අංක 7, හත්වැනි පටුමග,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථනය 826564

**ස්වස්ති සිද්ධම්**

ශ්‍රී බුඩවර්ෂ දෙදහස් පන්සිය සතලිස් එක්වැන්නෙහි උඳුවප් මස. අව අමාවක නම් තිථියලත් ඉරුදින හෙවත් රාජ්‍ය වර්ෂ 1997 නොවැම්බර් මස 30 වැනි දින. නුගේගොඩ, පාගොඩ 7 වැනි පටුමාවතේ අංක 7 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණේ මූලස්ථාන ශාලාවේදී පවත්වන ලද ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණේ 9 වැනි ජාතික සම්මේලනය විසින් සම්මතකොට

......පණවනලද......

# ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණේ ව්‍යවස්ථාව
## (ප්‍රතිපත්ති ප්‍රකාශනය අන්තර්ගත වූ පරිදි)

## ● 1. වගන්තිය

අ. හැඳින්වීම :-

I. ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණ මෙම දේශපාලන පක්ෂයේ නාමය වන්නේය. දෙමළ බසින්. ශ්‍රී லங்கா முற்போக்கு முன்னணி වන අතර ඉංග්‍රීසි බසින් (Sri Lanka Prograssive Front) වන්නේය.

II. ලේ රතු මුසු ගුරු පැහැය (Blood maroon) මෙම පක්ෂයේ නිල වර්ණය වන්නේය.

III. "මල් පෝච්චිය" මෙම දේශපාලන පක්ෂයේ අනුමත මැතිවරණ සළකුණ වන්නේය.

IV. මෙහි පිටකවරයේ මැද මුද්‍රාපිතව ඇති පරිදි කවාකාර ලෙසින් සැකසුණු ච් කරල් දෙකකින් වටවූ දැති රෝදය මැද මල් පෝච්චිය ලකුණද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් මෙම දේශපාලන පක්ෂය හඳුන්වන නාමයන්හි මුල් අක්ෂරද මුදුනත තරු පෙලක්ද ඇතුළත් කවාකාර මුද්‍රාව මෙම දේශපාලන පක්ෂයේ නිල ලාංඡනය වේ. මෙම නිල ලාංඡනයේ යාන්ත්‍රික මුද්‍රාව සභාපති මුද්‍රාව වශයෙන් වලංගු වේ.

V. 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතෙහි 7 (4) ඡේදයට අනුව මෙම දේශපාලන පක්ෂය ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගත් දේශපාලන පක්ෂයක් වන්නේය.

VI. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අනුගතව මෙම පක්ෂය මානව හිමිකම් පරිසර හා සමාජ සංරක්ෂණය පිණිස සක්‍රිය වූ පීඩන සමුද්දේශයක් ද වන්නේ ය.

ආ. කාර්යාලය

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගරසභා බල ප්‍රදේශයට අයත් නුගේගොඩ පාගොඩ පාරේ 7 වන පටුමගෙහි අංක 7 දරණ ස්ථානයේ අයිතිකරුවන්ගේ ලිඛිත කැමැත්ත හා අවසරය පරිදි පක්ෂ මූලස්ථානය පවත්වාගෙන යන අතර, කාර්යාලයේ ලිපිනය වශයෙන් මෙම ස්ථානයේ ලිපිනය පමණක් වලංගු වන්නේය.

## 2. වගන්තිය :- ප්‍රතිපත්ති

(I) ශ්‍රී ලංකාවේ ඓතිහාසික සංස්කෘතික උරුමයන් හා සාරධර්මයන් ආරක්ෂා කරමින් නොබෙදුනු හා ඒකීය ශ්‍රී ලංකාවක් තුළ යුක්තිසහගත සාධාරණ පාලන තන්ත්‍රයක් ඇති කරලීමටත් ඒ තුලින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැංවීමටත් පංති විරහිත සමාජ ක්‍රමයක් බිහිකිරීමටත් මංසැලසෙන ප්‍රජාතාන්ත්‍රිකවූද පරම අවිහිංසාවාදී වූද වැඩ පිළිවෙලක් සඳහා, ඇපකැප වූ දේශ සේවකයින් සේ ක්‍රියාකිරීම මෙම දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්තිය වන්නේය.

(II) රට අදල තුන් වැදෑරුම් අරමුණු හා පස්විසි වැදෑරුම් වැඩපිළිවෙලක් මෙහි පහත ප්‍රතිපත්ති ප්‍රකාශන වශයෙන් සංක්ෂිප්තව අනර්තර්ගත වන්නේය.

(III) <u>අරමුණු</u>

අ. ශ්‍රී ලංකාව බෙද පාලනය කිරීමට එරෙහිව, ජාතික එකමුතුවකට මංසැලසෙන සැබෑ පොදු පෙරමුණක් ගොඩනැගීම පිණිස පාර්ශවකරුවකු වීම.

අ. සියළු ප්‍රගතිශීලීන් ආරක්ෂාකර ලීම.

ආ. ජාතික නායකත්වය සඳහා සුදුසු ජනතා නියෝජිතයන් පුහුණු කරවීම.

(IV) <u>වැඩපිළවෙල</u>

**අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වරූපය**

මුළු රටටම එකසේ බලපාන නිදහස් හා සාධාරණ මැතිවරණයකින් පිරිනැමෙන ජනවරමක් තුලින් ස්ථාපිතවන්නා වූ ජනතා පරමාධිපත්‍යයට අනුව, රටේ භෞමික අඛණ්ඩතාවය, මූලික මිනිස් අයිතීන්, ජාතීන් අතර එකමුතුව හා ශ්‍රී ලංකාවේ ඒකීයභාවය පදානුගත අර්ථයෙන්ම සුරක්ෂිතවන්නාවූත් සැබෑ ලෙසින්ම ප්‍රජාතන්ත්‍රවාදී වූත් ප්‍රගතිශීලී සමුහාණ්ඩුවක් සඳහා වන ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම.

**ආ මැතිවරණ**

ශ්‍රී ලංකාව විසින් ද ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින, එක්සත් ජාතීන්ගේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් පරිදි නි යි ාලට පවත්වන සාධාරණ මහා මැතිවරණ තුළින් පිරිනැමෙන මහජන කැමැත්ත මත රටක් පාලනය විය යුතුය යන ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙතෙහි සාරය ලෙස දක්වා ඇති නිදහස් සමාන හා රහස්‍ය ඡන්ද විමසීම් ස්වරූපය පදානුගත අර්ථයෙන්ම ක්‍රියාත්මක කිරීමට රජය හා සියළු දේශපාලන පක්ෂ වගකීමෙන් බැඳිසිටිය යුතුය. රාජ්‍ය හෝ වෙනත් අයුතු බලපෑමකින් තොරව පිරිසිදු හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම පිණිස ජාතික හා ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම්වල අධීක්ෂණය යටතේ ස්වාධීන මැතිවරණ කොමිෂමක් මගින්, කාලීන මැතිවරණ නීති සංශෝධනයන්ට අනුකූලව එම මැතිවරණ පැවැත්වීම.

**ඇ ව්‍යවස්ථාදායකය**

පාලිතයනට සෘජුලෙසින්ම ස්වකීය පාලකයන්

හෝරාගැනීමට හා ක්‍රියාශීලී ඇපකැප වූ දේශසේවකයන් ඒ සඳහා පෙරී පත්වීමට ඇති ඉඩප්‍රස්ථා පුළුල් කෙරෙන අන්දමින්, ජනගහණ හා භූ විෂමතා පදනමක් මත නැවත ඡන්ද කොට්ඨාශ නිර්ණය කිරීමක් තුළින්, ඉහතින් දැක්වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ලෙස මහජන නියෝජිතයන්ගෙන් පමණක් සැදුම්ලත් නොබෙදුන ව්‍යවස්ථාදායකයක් (රාජ්‍ය මන්ත්‍රණ සභාවක්) ක්‍රියාත්මක කිරීමට ද එහි මන්ත්‍රීවරුන්ගේ සේවා හා චර්යාව පිළිබඳව වාර්ෂික අධීක්ෂණයන් කිරීමට හා රට අනුකූල ලෙස ඔවුන්ගේ පදවි කාලය දීමනා ඇගයීම් පිළිබඳ සුදුස නිර්දේශයන් ඉදිරිපත් කිරීමද ඇතුළු විධි විධාන සැලසීමට පූර්ණ බලය ඇති රාජ්‍ය පාලන කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම.

(ඈ) **විධායකය**

විධායක බලතල එක් පුද්ගලයෙකු සතුව පැවැත්මට දැඩිලෙසින් එරෙහිවන අතර, ඉහතින් දැක්වූ නොබෙදුන ව්‍යවස්ථාදයකයේ මන්ත්‍රීවරුන්ගේ වැඩි විශ්වාසය දිනාගන්නා පරිද්දෙන් අගමැති ඇතුළු ඇමති මණ්ඩලය තෝරා පත්කරගත යුතු වේ. සියළු මන්ත්‍රීවරුන්ට විධායක කටයුතු පිණිසද සක්‍රිය දයකත්වය සැපයීමට අවකාශ ඇති වන පරිදි අගමැති හා ඇමති මංඩලය සාමුහික වගකීමෙන් බැඳී විධායක බලතල ක්‍රියාත්මක කළ යුතුවෙයි. ව්‍යවස්ථාදයකයේ වැඩි විශ්වාසව ලබාගන්නා පුද්ගලයෙකු ජනාධිපති වශයෙන් පත්කෙරෙන අතර එම ධුරය සම්මානිත හා නාමමාත්‍රික විධායක ධුරයක් පමණි.

(ඉ) **අධිකරණය**

නීතිය ඉදිරියේ සෑම පුද්ගලයෙකුටම එක හා සමාන අයිතිවාසිකම් හිමිබව පිළිගැනෙන, සියළු දෙනාගේම මූලික අයිතිවාසිකම් සුරැකෙන, මහජනතාවට වඩාත් පහසුතාවක් ඇතිව කඩිනමින් හා නිසි අයුරින් යුක්තිය පසිදලන, පාදනුගත අර්ථයෙන්ම ස්වාධීන වූ අධිකරණ ක්‍රමයක් මුළු දිවයිනට එකසේ බලපාන අයුරින් ක්‍රියාත්මක කිරීමද, කාලීන අවශ්‍යතා හා ජනතා සුභසාධනය පදනම් කොට නීති පද්ධතියේ හා බන්ධනාගාරවල පූර්ණ ප්‍රතිසංවිධානයක් කිරීමට ද, රාජ්‍ය බලපෑමෙන් විනිර්මුක්ත වූ අධිකරණ සේවා කොමිෂන් සභාවක් මගින් සමස්ත අධිකරණ ව්‍යුහයේ මනා පාලනයක් සැලසීමට විධිවිධාන යෙදීම.

(ඊ) **බලය බෙදාහැරීම**

ඒකීය ශ්‍රී ලංකාවක් තුළ ජාති, ආගම් හා සංස්කෘතික විචලතාවන්ගේ බලපෑමකින් තොවර, ජාතික සංවර්ධනය පිණිස ඉවහල්වන භූගෝලීය, පරිපාලන පහසුව සංවර්ධනය හා සමානාත්මතාවය යන පදනම් සලකා, මධ්‍යම ආණ්ඩුවට යටත්ව කෘෂිකර්ම ධීවර, විද්‍යාත්මක පර්යේෂණ කාර්මික අභ්‍යන්තර වෙළඳාම මහා මාර්ග ප්‍රවාහන නගර හා ග්‍රාමීය පාලනය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන බලතල ප්‍රදානයට හේතුවන අයුරින්, රුහුණු, මායා, පිහිටි, යාපන, අම්පාර, කඳුරට හා ඌව සබරගමු යනුවෙන් හෝ වෙනත් යෝග්‍ය ආකාරයකින් දිවයිනේ සංවර්ධන කලාප ස්ථාපිත කෙරෙන අතර, ඒවායේ

ව්‍යුහය මැතිවරණ පැවැත්වීම අයිතිවාසිකම් හා බලතල පිළිබඳව අදල විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත කිරීම.

(උ) **ප්‍රාදේශීය පාලනය**

පොදු ජනතාවට වඩාත් සමීප පොදු සේවාවන් සැපයෙන හා ප්‍රදේශික මට්ටමේ සිට ජාතික මට්ටම තෙක් දේශපාලන නායකත්වය පුහුණු කරලු ගම්සභා හා නගර සභා යන අංගද්වයෙන් පමණක් එකී බල ප්‍රදේශයන්හි පාලන සේවා විධිමත්ව සිදුවීම පිණස සමාන ඒකක ලෙසින් සීමා නිර්ණය කිරීමක් තුළින් කාර්යක්ෂම, ස්ථිර හා සිත්ගන්නා සුළු සේවාවන් රැසක් උපරිම දියුණු මට්ටමකින් පවත්වා ගැනීමට සංවර්ධන කලාප හා බද්ධකොට ක්‍රියාත්මක කිරීම.

(ඌ) **ආරක්ෂාව**

ආරක්ෂක අමාත්‍යවරයා යටතේ, ත්‍රිවිධ හමුදව හා පොලිසිය මගින් පමණක් මෙහෙයවන අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස, ජාතික ආරක්ෂාව ක්‍රියාත්මක විය යුතුය. දේශය, ජන ජීවිතය හා පොදු දේපල ආරක්ෂා කිරීමත්, රටේ නිතිය හා සාමය පවත්වා ගැනීමත්, අපරාධ, දූෂණ හා අක්‍රමිකතා වැලැක්වීමත් මහජන සේවාවන් වඩාත් පහසු හා විධිමත් ලෙස පවත්වා ගැනීමට සහාය වීමත් ඉන් අපේක්ෂා කෙරේ. සැම ග්‍රාම සේවා බලප්‍රදේශයකම ඇති කරන මහජන ආරක්ෂක කමිටු තුලින් අවබෝධය හා නිරන්තර සම්බන්ධතා වැඩි දියුණු කිරීමද සියළු ආරක්ෂක සේවාවන්හි ස්ථාවරත්වය, සුරක්ෂිතභාවය, අභිමානය, විනය හා ආචාරශීලීත්වය මූර්තිමත්වන අයුරින් පවත්වාගෙන යාම පිණිස ද අදළ ප්‍රතිශෝධන කිරීම.

(එ) **ආගම**

ලෝක සාමය වෙනුවෙන් ශ්‍රී ලංකාවට දියහැකි උසස්ම දයාදය වූ නිර්මල ථෙරවාදී බුඬ ධර්මයේත් බුඬ ශාසනභාරධාරී පූජ්‍යතම මහාසංඝරත්නයේත් අනුශාසකත්වය ගෞරවණීයභාවය හා පිළිගැනීම ස්ථාවර වන පරිද්දෙන් ශ්‍රී ලංකාවාසීන් අදහන බෞද්ධ, හින්දු - ඉස්ලාමික, ක්‍රිස්තියානි හා රෝමානු කතෝලික ආදී සියළු ආගම්වලට හිමි ගෞරවය ඇදහීම් නිදහස හා ආරක්ෂාව රජය විසින් සහතික කරන අතර, එක් ආගමක් බිලිදී තවත් ආගමක් ප්‍රචාරය කිරීම හෝ දිළිඳුබව අසරණබව අනාරක්ෂිතබව හෝ වෙනත් හේතුවක් නිසා බලහත්කාරයෙන් හෝ උපායශීලීව අන්‍ය ආගම් වැළඳගැන්වීමට කරන සියළු ජාතික හා ජාත්‍යන්තර බලපෑම් සම්පූර්ණයෙන් තහනම් කෙරෙන අතර, ආගමික නිදහස හා සාමකාමී සහජීවනයෙන් යුතු ආගමික පරිසර ගොඩනැංවීමට හේතුවන නීති පැනවීමත් සියළුම ආගමික සංස්ථාවන්හි අධිකාරී බලය හා පාලක රක්ෂණ බලතල පූජ්‍ය උතුමන් හා දයක පක්ෂයෙන් සුසැදි නීතිගත සංවිධානයනට පවරා රජය රට සියළු අනුග්‍රහය ආධාර හා සහාය දැක්වීමේ සාධාරණීකරණය වූ ආගමික පිළිවෙතක් අනුගමනය කිරීම.

(ඒ) **භාෂාව**

සිංහල දෙමළ හා ඉංග්‍රීසි ජාතික භාෂා ලෙසින් ක්‍රියාත්මක කරන අතර, පාසල් විෂය නිර්දේශ තුලින් එම භාෂා අධ්‍යාපනය ප්‍රචලිත කිරීමද ප්‍රාචීන හා ප්‍රතිචීන සියළු භාෂාවන් අභිමත ලෙසින් හැදෑරීමට හා ප්‍රගුණ කිරීමට සියළු පහසුකම් සැලසීම.

(ඔ) **සංස්කෘතිය**

සදචාර පරිහාණියට හා ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සංස්කෘතික උරුමය විකෘති කෙරෙන පරිද්දෙන් සිදුවන සියළු විදේශ බලපෑම් හා ආක්‍රමණයන්ගෙන් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක සංස්කෘතික හා සදචාරත්වය දැඩිලෙසින් ආරක්ෂාකරගත හැකිවන ලෙසත්, විනාශකාරී නාස්තිකාර හා බාහිර ආටෝපයන් ගෙන් විනිර්මුක්තව සංවරශීලීව චාම් දිවි පෙවතක් ඇති කළ හැකි ලෙසත් අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් සිදුකළ යුතු අතර සංගීත, නාට්‍ය, ගායනා, චිත්‍ර කලා ශිල්ප පමණක් නොව සිනමාව යන අංශද රට අදල ලෙස උපරිම දියුණු තත්ත්වයකට පත්කිරීමට කිසිදු සීමාවකින් තොරව සියළු කලාශිල්පීන්ගේ සහභාගිත්වය ලබාගැනීම.

(ඕ) **අධ්‍යාපනය**

අභිමානවත් ජාතියක් ගොඩනැංවීමට ඉවහල් වන්නාවූත්, නිර්මාණ ශක්තිය හා කුසලතා ඔප්නංවන්නාවූත්, ඵලදයි සේවාවන් සඳහා ඇති හිමිකම් සහතික කරන්නාවූත් අධ්‍යාපනය මුළුමනින්ම රජයේ වගකීමක් වෙයි. පශ්චාත් ප්‍රාථමික මට්ටම තෙක් සියළු ශ්‍රී ලාංකික දරුවනට අධ්‍යාපනය අනිවාර්යකළ යුතු අතර, නිදහස් අධ්‍යාපන සංකල්පය සමාන අවස්ථා සලසන සම්පත් සමානව බෙදී යන, ජනවාර්ගික, භාෂා ආගම් හා ඇති නැති පරතරය වැනි විෂමතා දුරලන විධිමත් සැලැස්මකට අනුව යෝග්‍ය විෂය මාලාවලින් සම්පූර්ණව ක්‍රියාත්මකවීම පිණිස "ජාතික අධ්‍යාපන අධිකාරියක් යටතේ" පාලනය විය යුතුය. අධ්‍යාපන සුදුසුකම හා ඉගැන්වීමේ හැකියාවට ප්‍රමුඛත්වය දෙමින් වාර්ෂිකව ගුරුවරුන් බඳවා ගැනීම පුහුණු කිරීම හා අතිරේක සේවාවන්හි නිරත කිරීමේ වැඩ පිළිවෙලක් යටතේ සියළුම ගුරුවරුන්ගේ උද්යෝගය, බුද්ධිය හා සේවයේ නිදහස හා ගෞරවය උපරිම මට්ටමකින් සැලසෙන පරිදි, සියලු පාසැල් ගුරු විද්‍යාල කාර්මික විද්‍යාල හා පිරිවෙන් වල විධිමත්බව ආරක්ෂා කිරීම හා බරපතල ගුරු හිගයක් ඇති නොවීමට විශේෂ අවධානය යොමු කිරීමද, ජාතියේ ප්‍රගතියට හේතුවන විද්වතුන් බිහිකරන විශ්ව විද්‍යාලයන් හි "ජාතික හා විශ්ව" ස්වරූපයද, පූර්ණ ස්වාධීනත්වයද පදනුගත අර්ථයෙන්ම ආරක්ෂා කරන පරිදි කිසිදු වර්ගීකරණයකින් හෝ අව ප්‍රමාණ කිරීමකින් තොරව ජාතික හා ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති සම්භාව්‍ය ආයතන වශයෙන් විශ්ව විද්‍යාලවල පූර්ණ ප්‍රතිසංවිධානයක් කිරීම.

(ක) **ආර්ථිකය**

සිව්වැදෑරුම් සමතුලිත පිළිවෙතකට අනුව (රාජ්‍ය, රාජ්‍ය අනුබද්ධ සමුපකාර හා පෞද්ගලික) ශ්‍රී ලංකා ආර්ථිකය දැඩි ලෙසකින් හසුරුවමින් සියලු

ආර්ථික ව්‍යුහයන් තුළ වේගවත් සංවර්ධනයක් ඇතිකිරීමට වහා පියවර ගැනීම.

**(i) කෘෂිකර්මය**

ශ්‍රී ලංකාවේ බහුතර ජනතාවගේ මන්දපෝෂණය හා දිළිඳුකම මුලිනුපුටා දැමීමේ කාර්යයට උරදෙනුවස්, දේශීය කෘෂිකර්මාන්තය, ප්‍රධාන ආර්ථික පදනම ලෙස නංවාලිය යුතුය. විවිධ සහනාධාර, භෝග රක්ෂණ ව්‍යාපෘති හා පර්යේෂණ සේවා ඇතුළු අතුරු ව්‍යුහයන් ප්‍රවර්ධනය කරන, අතර, ගොවිතැනට අවශ්‍ය ඉඩම්, ජලය, ණය, වාසස්ථාන හා අදගොවි අයිතිය ඇතුළු වෙනත් සියළු වරප්‍රසාද තහවුරු කරදීමද සියළු භෝගයන්, අතුරු ව්‍යුහයන්, තත්ත්වපාලන කටයුතු වෙනුවෙන් දිරිදීම් ඇතුළු සහතික මිලක් ඇති කරණ වෙළඳපලක් ස්ථාපනය කරණ අතර, දේශීය කෘෂිකර්මාන්තයට බරපතල හානි පමුණුවමින් බහුජාතික සමාගම් මගින් ගෙන්වනු ලබන කෘෂිරසායන හා මෙවලම් වෙනුවට "කෘෂිකර්ම අධිකාරියක" අධීක්ෂණය යටතේ වන රසායන වර්ග හා උපකරණ යොදගැනීමට හා දේශීය පර්යේෂණක්‍රම භාවිතයටත් අවශ්‍ය පියවර ගැනීම.

**(ii) ධීවර**

දේශීය සාගර කලාපය ධීවර හා අතුරු නිෂ්පාදන කලාපයක් ලෙස සංවර්ධනය කර පවත්වා ගැනීම හා තනිකර විදේශ පරිහරණයට ලබා නොදීම ද ටින් මාළු වියළි මාළු හා මුහුදු පැළෑටි කර්මාන්තය පමණක් නොව, මිරිදිය ධීවර කර්මාන්තයේ ද නවීකරණයක් ඇති කරමින් සාගර හා ජලජ සම්පත් වලින් ඵලදායී නිෂ්පාදන වැඩි දියුණු කිරීමද සහනදායීලෙස ධීවර ආම්පන්න ට්‍රෝලර් යාත්‍රා ලබාදීම ණය හා රක්ෂණ පහසුකම් සැලසීම ද, පර්යේෂණ, අධ්‍යාපන නවීන පහසුකම් හා සෞඛ්‍යාරක්ෂක විධීන් අනුව ධීවර ජනාවාස පවත්වා ගැනීමට ද, වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු අතර, ශ්‍රී ලංකාවේ ජාතික ආදයමෙන් වැඩි කොටසක් මහ මුහුදෙන් ලබාගැනීම පිණිස උද්‍යෝගීමත් ප්‍රතිංසවිධානයක් මත ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම.

**(iii) වැවිලි**

තේ, රබර්, පොල්, කුළුබඩු, පළතුරු, මල්, බුලත්, වේවැල්, උණ හා විසිතුරු පැළෑටි ආදිය ද පරිසරය සුරැකීමේ මගක් වශයෙන් වන වගාවද වැවිලි අංශයේ ලා විශේෂ ප්‍රමුඛත්වයකින් සැලකිය යුතු කාලයක අපි ජීවත්වෙමු. සියළු රාජ්‍ය වැවිලි එකම අධිකාරයක් යටතේ ක්‍රියාත්මක විය යුතු අතර, දැනට නිෂ්පාදනය අංශයෙහි දුර්වල වූ පාඩු ලබන සියළු වතු ඵලදායි නිෂ්පාදන මට්ටමකට ගෙන ඒමේ එක් පියවරක් වශයෙන් "වතු අද අයිතියට පැවරීමේ" සැලැස්මක් ගැන යෝජනා කරමු. සියලු වගාවන් සිව්වැදෑරුම් සමතුලිත ක්‍රම යටතේ වැඩි දියුණු කිරීමට පියවර ගත යුතුය. මුඩු ඉඩම් නව වගාවන්

සඳහා ද වගාකළ ඉඩම් වල අතුරු භෝගයක් යෙදවීමට ද සුළු අපනයන භෝග සඳහා රාජ්‍ය අලෙවි මධ්‍යස්ථානය ක්‍රමවත්ව පිහිටුවීමද ඊට් වතු ආශ්‍රිතව ගොවි ගම්මාන ඉදිකිරීම ද වැවිලි කර්මාන්තය මුළුමනින්ම පර්යේෂණ සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමට ද පියවර ගැනිම.

**(iv) කර්මාන්ත**

සියළු දේශීය කර්මාන්ත වැඩි දියුණු කරමින්, එයට පිටුවහලක් වන ලෙස ආනයන සීමා ඇති කිරීමටත්, ප්‍රාග්ධන සුක්ෂම කර්මාන්ත වෙනුවට පළමු අදියරේ ශ්‍රම සුක්ෂම කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමටත්, දේශීය බලශක්ති ප්‍රභව මගින් නව කර්මාන්ත ඇතිකිරීම හා පවත්වා ගැනීමටත් පියවර ගතයුතුය. දැනට පෞද්ගලික හා විදේශ කොම්පැනිවලට පවරා ඇති රාජ්‍ය අංශයේ පැවති සියළු කර්මාන්ත ආයතන පියවරෙන් පියවර රජයේ වගකීම ඇති අධිකාරියකට පවරාගෙන ක්‍රමානුකූල දියුණු තත්ත්වයකට පත් කිරීමට ද 21 සියවසට පාතබන නව සමාජය හා මුහුණ දිය හැකිපරිද්දෙන් දෙවැනි අදියරේදදි ප්‍රාග්ධන සුක්ෂම කර්මාන්ත ආරම්භ කිරීමට ද පෞද්ගලික අංශයේ සියළු කර්මාන්ත සඳහා සියළු දිරිගන්වීම් කිරීමට ද උතුරු වෙරළේ ඛණිජ තෙල් පර්යේෂණ කටයුතු හා විද්‍යාත්මක ගවේෂණයන් ඇරඹීමට ද ක්‍රියාකිරීම.

**(v) වෙළඳම හා තත්ව පරීක්ෂාව**

ආනයන හා අපනයන වෙළඳම සම්පූර්ණයෙන් රාජ්‍ය අංශය සතුව ක්‍රියාත්මක විය යුතුය. ආහාර හා භාණ්ඩ පිළිබඳ අභ්‍යන්තර වෙළඳ කටයුතු සංවර්ධන කලාපයන් යටතේ සිවිවැදෑරුම් සමතුලිත ක්‍රම මත රජයේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන, ආනයන කරන හා අලෙවිකරණ සියළු ආහාර, ඖෂධ, උපකරණ, යන්ත්‍රසූත්‍ර හා වාහන, පිළිබඳ විද්‍යාත්මක තාක්ෂණික අගය, කල්පැවැත්ම, ප්‍රමිතිකරණය මිල හා ප්‍රචාරක මාධ්‍ය පිළිබඳ නිෂ්පාදන, සෞඛ්‍ය හා වාණිජ්‍ය මට්ටමෙන් සිදුවියහැකි සියළු අනර්ථයන් වළක්වාලීම සඳහා, රාජ්‍ය තත්ත්ව පරීක්ෂණ අධිකාරියක් ද ක්‍රියාත්මක විය යුතුය.

**(vi) සංචාරක සේවා**

සංචාරක සේවය රාජ්‍ය අධීක්ෂණය යටතේ සිවි වැදෑරුම් පිළිවෙත යටතේ සමතුලිත අංශ මත ක්‍රියාත්මක කළ යුතුය. හෝටල් හා නිවාඩු නිකේතන විදේශ සංචාරකයන්ට පමණක් නොව ස්වදේශිකයන්ට ද සාධාරන ලෙසින් ප්‍රයෝජනයට ගැනීමේ පිළිවෙතක් ගැන අවධානය යොමුකරන අතර ශ්‍රී ලංකා ඉතිහාසය, සංස්කෘතිය හා ස්වභාවික සෞන්දර්යය විශ්ව ව්‍යාප්තියට හේතුවන ආයතන ලෙසත් පූජනීය හා ඓතිහාසික ස්ථානවල ගෞරවයට හානිනොවන ලෙසත් සංචාරක

සේවය පවත්වාගත යුතුය.

**(vii) සම්පත්**

උල්පත් දිය ඇලි වැව් ගංගා යනාදී ස්වාභාවික පැරණි ජලමාර්ග විධිමත් ලෙස ප්‍රතිසංවර්ධනය කොට නාගරික ප්‍රදේශ හා වියළි කලාපයට ජලය ලබාදීමට ද නිකරුනේ මහ මුහුදට වැටෙන ජලය සමීප රටවලට ලබාදීමට ද ජලසම්පතෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමෙන් පෘතුවි සාරය හා වන පෙත්වල ආරක්ෂාව සැලසීමට ද රට අනුරූපවන සේ අඩවි වන දෙපාර්තමේන්තුව හා දැව සංස්ථාවද ඒකාබද්ධ ක්‍රමානුකූල සේවා ව්‍යුහයක් පැවැත්වීමට ද සියළු භූ සම්පත් හා සුරාකෑමෙන් තොරව මිනිස් සම්පතද කාර්යක්ෂම ලෙස උපයෝජනයට මං සලසන්නාවූ සැලසුම් ගත ඒකාබද්ධ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

**(viii) මූල්‍ය කටයුතු**

මූල්‍ය ප්‍රතිපාදන කටයුතු සම්පූර්ණවශයෙන් ජාතික මූල්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක කළ යුතුය. ශ්‍රී ලංකාවේ සංවර්ධනය, ජාතික ගැටළු හා පොදු ජන අවශ්‍යතා නොසලකා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා වෙනත් අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතන වල උපදෙස් පිළිපැදීමෙන් ගතවූ කාලය තුල උග්‍රවූ ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් මගහැරවීම පිණිස විදේශ ණය පොලී අනුපාතයන් සියළු ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් මගහැරවීම පිණිස විදේශ ණය පොලී අනුපාතයන් සියළු ආර්ථික ගිවිසුම් - සියළු අන්දමේ බදු, විනිමය නීති, හා කොමිස් ආදී සියලු දේ පිළිබඳව සමාලෝචනයක් කොට මූල්‍ය ප්‍රතිපාදනයන් පිළිබඳ ස්වාධීන වූ ස්ථාවර පිළිවෙතක් ක්‍රියාත්මක කළයුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා රාජ්‍ය උගස් බැංකුවද රාජ්‍ය බැංකු වශයෙන්ම පවත්වා ගතයුතු අතර ඒවා කිසිම අයුරකින් හෝ වාණිජකරණ මට්ටමකට අවප්‍රමාණ නොකිරීම.

(ඛ) **සෞඛ්‍ය**

ජනතාවගේ සෞඛ්‍ය සංරක්ෂණය රජයේ වගකීමක් වන හෙයින් ශ්‍රී ලංකාවාදී සියළු පවුල් ඒකක වශයෙන් ගෙන නිවැරදි සෞඛ්‍ය වාර්තා තැබීම හා නිරීක්ෂණයන් තුළින් රෝග නිවාරණ හා සවස්ථතාව පිළිබඳ උනන්දුව දැනුම් සෞඛ්‍ය සිරිත් භාවිතය වැඩි දියුණු කිරීමට ද ජංගම වෛද්‍ය සේවා හා අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඇති කරන ආරෝග්‍යශාලා මගින් ළදරු සායනික, මාතෘදරකාභිවෘද්ධි, ප්‍රථමාධාර, රෝග නිවාරණය හා ප්‍රතිකාර සැලසීමද ක්‍රියාත්මක විය යුතුය. පාරම්පරික, ආයුර්වේද, කටුචිකිත්සා හෝමියෝපති හා බටහිර වෛද්‍ය ක්‍රමය පමණක් නොව පශු හා සත්ව වෛද්‍ය සේවාවන්හිද උපරිම දියුණුවක් ඇතිවන පරිදි සැලසුම් සහගත ජාතික සෞඛ්‍යසේවාවක්

මුළු දිවයින පුරා ව්‍යාප්ත කළ යුතු අතර වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය සේවයේ සියළු ක්ෂේත්‍රයන් තුළ ඌණ පූරණයන් ඇති කරවමින් එම සෞඛ්‍ය සේවාවන්ට කිසිත් අවහිරයක් ඇති නොවන අයුරින් හා වෛද්‍යවර්යාධර්මයන්ට අනුකූලවන පරිද්දෙන් පෞද්ගලික වෛද්‍ය සේවයට අවශ්‍ය නිදහස ලබාදීම.

(ග) **නිවාස**

ස්ථිර පදිංචිය සඳහා රජයේ මැදිහත් වීමෙන් නිවාස යෝජනා ක්‍රම සැකසීමේදී සම්පූර්ණ සැලකිල්ල යොමුවිය යුත්තේ නාගරික හා දියුණු ග්‍රාමීය පෙදෙස්වල ඇති හිස් ඉඩම් හා සම්පූර්ණ අබලන් වූ ගොඩනැගිලි ඉවත් කළ ඉඩම් ඒ සඳහා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමය. එවැනි භූමිවල ආරක්ෂක, සෞඛ්‍ය හා ශක්තිමත් තත්ත්වයන් මත මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීම කෙරෙහි ප්‍රමුඛත්වය දිය යුතු අතර වනාන්තර එළි පෙහෙළි කිරීමෙන්ද කඳුමුදුන් හා ඈත දුෂ්කර ප්‍රදේශවල අළුත් ගම්මාන ඉදිකිරීම පරිසර විනාශය, නාස්තිය, අනවශ්‍ය වියදම් හා අතිරේක පහසුකම් සැලසීම පිළිබඳ ගැටළු වලට මුහුණපෑමට සිදුවන හේතුවකි. රජයේ නිවාස යෝජනා ක්‍රම ඇතිවීමෙන් කුලී නිවැසියන්ගේ හා එක නිවසක පවුල් දෙක තුනක් විසීමේ ප්‍රශ්නද අඩුවිය යුතුය. අනුමත සැලසුමකට අනුව නිවසක් ඉදිකිරීමේදී වඩාත් කඩිනමින් ණය පහසුකම් ලබාගැනීමට ද වැඩි වාරිකයකින් අඩු පොළියක් සහිතව ඒවා ආපසුගෙවීමට ද අදාළ වැඩපිළිවෙලක් සකස් කිරීම.

(ඝ) **ප්‍රවාහන**

ජනතාවට පහසු හා ඉක්මන් ප්‍රවාහන සේවාවක් සැලසීම පිණිස දුම්රිය, ගුවන් හා නාවික සේවා හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යළිත් යථා ස්ථානයට පත්කොට රාජ්‍ය ප්‍රවාහන සේවා ලෙස පවත්වාගෙන යා යුතු අතර, අභ්‍යන්තර බස්සේවා, කුලී, සංචාරක ත්‍රිරෝද හා ගංගාශ්‍රිත පාරු ආදියත් කොළඹ හා තදසන්න පෙදෙස්වල උමං දුම්රිය ඉදිකිරීමද සංවර්ධන කලාප යටතේ රාජ්‍ය අනුබද්ධ සමුපකාර හා පෞද්ගලික අංශ මගින් ක්‍රියාත්මක විය යුතුයි. විදේශ ගුවන් හා නාවික සේවා රාජ්‍ය අනුබද්ධ හා පෞද්ගලික අංශ මගින්ද ක්‍රියාත්මක කිරීම.

(ඞ) **තරුණයන් හා ශිෂ්‍යයන්**

ජාතියේ වටිනතම මානව සම්පත ජනගහණයෙන් අධි බහුතරය වන තරුණයන් හා ශිෂ්‍යයන් බව අවධාරණය කරමින්, ඔවුන්ගේ ආරක්ෂාව, අභිවෘධිය සහතික කරන්නාවූත් ඔවුන්ගේ සහභාගිත්වය ජාතික සංවර්ධනයෙහි ලා අනිවාර්ය වන දීපව්‍යාප්ත වැඩ පිළිවෙලක් අඛණ්ඩව ක්‍රියාත්මක කරණුවස්.

තරුණ ශිෂ්‍ය කටයුතු සම්බන්ධව වෙනමම අමාත්‍යාංශයක් ඇති කිරීම.

(ඩ) කාන්තාවන්

ජනගහණයෙන් හරි අඩක් පමණ වන කාන්තාවන්ගේ ආර්ථික සෞඛ්‍ය සදාචාරාත්මක හා සංස්කෘතික අභිවෘද්ධින් වෙනුවෙන් සුවිශේෂ වන්නාවූද, කාන්තාවක නිසා වන වෙනස්කම් නැති කරන හා තරුණි, ගෘහණි, මාතා හා වැන්දඹු වශයෙන් විවිධ අවස්ථාවන්හි ඔවුන්ට උද්ගතවන ගැටළු සම්බන්ධයෙන් සහනශීලී අනුග්‍රහයන් සලස්වන්නාවූද, පවුලක හා ජනසමාජයක යහපත කෙරෙහි කාන්තාව සතු වගකීම හා දුරාතීතයේ සිට ශ්‍රී ලාංකික වනිතාවනට තිබුන ගෞරවය හා පිළිගැනීම ඇති කරවිය හැකි පරිදි විවිධ ව්‍යාපෘතීන් හා සේවාවන් ක්‍රියාත්මක කෙරෙන ජාතික කාන්තා කාර්යාංශයක් ඇති කිරීම.

(ජ) වෘත්තීය අයිතීන් වගකීම් හා යුතුකම්

සියළු ක්ෂේත්‍රවලට අයත් බුද්ධිමය දේපල හා කායික ශ්‍රමය සුරා කෑමට එරෙහිව, ඒ සියළු දෙනාගෙන්ම සැලසෙන ජාතික මට්ටමේ ඵලදායි සේවාවන් සඳහා වූ ඉඩ ප්‍රස්ථා පුළුල් කෙරෙමින් වැඩ කරන ජනතාවගේ යුක්තිසහගත හා සාධාරණ ඉල්ලීම්වලට කඩිනම් විසඳුම් ලබාදීමටත්, ඔවුන්ගේ සේවාවන් හා අයිතීන් සුරක්ෂිත කිරීමටත් ජාතික සංවර්ධනය වෙනුවෙන් ඔවුන්ට දයකත්වය මෙන්ම නායකත්වය සැපයීමටත් අයිතිවාසකම් මෙන්ම වගකීම් හා යුතුකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ශික්ෂණයකට ඉවහල් වන පරිදි කිසිදු රාජ්‍ය හෝ දේශපාලනික මැදිහත්වීම්වලින් විනිර්මුක්ත වූ ස්වාධීන එකම වෘත්තිය සංවිධානයක් යටතේ සියළු වැඩ කරන ජනතාව සංවිධානය කළ යුතුවේ. පරිපාලන - ආරක්ෂක සේනා හා විශ්‍රාමික යන්නේ සේවා අයිතීන් ද සුරක්ෂිත කිරීම.

(ජ) රැකීරක්ෂා

ද්විතියික අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපන පිවිසුමට යෝග්‍යතාවන් නොමැති වූ සියළු තරුණයනට ඔවුන්ගේ දැනීම, කුසලතා, දක්ෂතා හා රුචිය මත රැකියා අවස්ථා උදාකරදීමටත්, දීමනා ලබන පූර්ව ආධුනික සේවා මගින් ස්ථාවර රැකියාවකට ඉඩ ප්‍රස්ථා ලබාදීමටත්, සෑම ඉදිරි වර්ෂයකටම ජනවාරි 1 ද සිට සේවාවන් වෙනුවෙන් කලින් වර්ෂයේ නොවැම්බර් 1 දා සිට යුක්ති සහගත සාධාරණ පදනමක් මත රැකියාවන් ලබාදීමටත්, එකී සියළු අවස්ථාවන් ගිලිහී යන සියළු දෙනා රැකියා හා වෙනත් ජීවනෝපාය මාර්ගයන්හි යොමු කිරීමට බැංකු ණය, ආහාර - නිවාස හා සෞඛ්‍ය පහසුකම් සලසාදීමටත් රජය

වගකීමෙන් බැඳී ක්‍රියා කිරීම.

(ඤ) **වැටුප් හා දීමනා**

රාජ්‍ය පාලකයන් ඇතුළු රාජ්‍ය අනුබද්ධ, සමුපකාර හා පෞද්ගලික යන සියළු අංශවල වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ඇති විෂමතා දුරලන ජාතික වැටුප් පිළිවෙතක් වහා ක්‍රියාත්මක කළ යුතුව ඇත. සියළු ක්ෂේත්‍රවල වැටුප්, දීමනා හා විශ්‍රාමික වැටුප් සම්බන්ධයෙන් ඇති අසමානතාවයන් මේ මගින් දුරලිය යුතු අතර සේවක අර්ථසාධක අරමුදල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වැන්දඹු හා අනත්දරු අරමුදල ද වඩා සුරක්ෂිත ලෙසින් විධිමත්ව ක්‍රියාත්මක කිරීම.

(ඇ) **ක්‍රීඩා**

විශේෂයෙන් දේශීය ධන සම්පත් බහුල වශයෙන් වැය නොවන ක්‍රීඩාවන් ඇතුළු සියළු ජාතික ක්‍රීඩා සඳහා මූල්‍ය ප්‍රතිපාදනයන් ඇති කිරීමත් තෘතීය අධ්‍යාපන මට්ටම තෙක් ක්‍රීඩා ව්‍යාප්ත කිරීමත්, පුහුණු සංචිත පවත්වාගෙන යාමත් දේශපාලනඥයන්ගේ මූලිකත්වයෙන් තොරව ස්වාධීන ලෙස ක්‍රීඩා සංගම් සංවිධානය කිරීමත් ක්‍රීඩා තරගවලදී සිදුවිය හැකි සියළු අක්‍රමිකතාවන් මුළුමනින්ම නවතාදමා විදේශ තරග වලට සහභාගී වන සෑම ක්‍රීඩකයෙකු වෙනුවෙන්ම රජය මූලික වියදම් දැරිය යුතු අතර, සමස්තයක් වශයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ ප්‍රතිසංස්කරණයක් කළයුතු වීම.

(ට) **සංනිවේදන**

තැපැල් හා විදුලි සංදේශ සේවා රාජ්‍ය මූලිකත්වයෙන් ද වෙනත් සියලු විද්‍යුත් ජන මාධ්‍යසේවා හා පුවත්පත් සත්‍යගරුකව රටේ සංස්කෘතික සාරධර්මයන්ට අනුකූලව හා සම්පූර්ණයෙන් ස්වාධීන ආයතන ලෙස නව තාක්ෂණික ක්‍රම භාවිතයක් ඇතිව පවත්වා ගැනීමද සියළු ජනමාධ්‍යවේදීන් හා ශිල්පීන්ගේ කුශලතා ඇගයීම සේවාවන්හි ස්ථාවරභාවය උසස්භාවය හා ආරක්ෂාව සැලසීමටද අවශ්‍ය සියළු විධිවිධානයන් සැලසීමට "ස්වාධීන ජනමාධ්‍ය කොමිෂමක් ක්‍රියාත්මක කිරීම.

(ඨ) **පාලන හා සමාජ ප්‍රතිසංස්කරණය**

අධිරාජ්‍යවාදී යටත් විජිත නෂ්ටාවශේෂ ක්‍රම ප්‍රතිසංස්කරණය කරන අතර, නිලධරවාදය, අත්ලස, දේශපාලන බලපෑම් හා වෙනත් දූෂණ හෝ අක්‍රමිකතාවන්ගෙන් තොරව, පොදු ජනතාවට කාර්යක්ෂමව සාධාරණව හා වඩාත් පහසුවෙන් සිය සේවාවන් ඉටුවීමට අවශ්‍ය සියළු විධිවිධාන යෙදීමත් නීති

විරෝධී සුරා හා සුදු, මත්ද්‍රව්‍ය, අසභ්‍ය පුවත්, අසභ්‍ය චිත්‍රපට, ළදරු ජාවාරම් ගණිකා හා වෙනත් එවැනි සියළු දුශ්චරිත ක්‍රියාවන් නීති විරෝධී ලෙස සම්පූර්ණයෙන් තහනම් කරමින් සංවරශීලී සමාජයකට අනුරූප වන සමාජ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට දැඩි පියවරක් ගැනීම.

(ඪ) **විදේශ කටයුතු**

සාමකාමී සහජීවනය පදනම් කරගත් පංචශීල ප්‍රතිපත්තියට අනුව, යුදකඳවුරු හා බල කඳවුරුවලට නොබැඳුන, කලාපීය ආරක්ෂාව, ජාත්‍යන්තර මිත්‍ර සම්බන්ධතා සහ අන්‍යෝන්‍ය අවබෝධය තහවුරු කෙරෙන "ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක්" ක්‍රියාත්මක කරනු ලැබේ. විදේශ තානාපති සේවාවන්හිදී බුද්ධිය, අවබෝධය කාර්යක්ෂමතාව, ශ්‍රී ලංකා ප්‍රතිරූපයේ ගෞරවය හා අභිමානය තහවුරු කෙරෙන ආකාරයෙන් පූර්ණ ප්‍රතිසංවිධානයක් කරනු ලබන අතර, විදේශ රැකියාවන්හි නියුතු සියළු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ නිදහස, ආරක්ෂාව හා මනා සෞඛ්‍යය සහතික කෙරෙන ජාත්‍යන්තර ක්‍රියා පිළිවෙලක් ද අනුගමනය කිරීම.

## 3. වගන්තිය

පක්ෂ ව්‍යුහය

**ආ. මෙම දේශපාලන පක්ෂය පහත සඳහන් සංවිධාන වලින් යුක්ත වන්නේය.**

1. ප්‍රධාන සංවිධාන
2. අනුබද්ධ සංවිධාන
3. වෘත්තීය සංවිධාන
4. අනු මණ්ඩල

**ආ. ප්‍රධාන සංවිධාන**

1. කමිටු
2. ශාඛා
3. දිසා කමිටු
4. කලාපීය සංවිධාන
5. මධ්‍යම කාරක සභාව
6. දේශපාලන මණ්ඩලය
7. ජාතික නියෝජිත සභාව
8 ජාතික සම්මේලනය

**ඇ. අනුබද්ධ සංවිධාන**

ශ්‍රී ලංකා ප්‍රගතිශීලී යන පූර්වනාමයෙන් හැඳින්වෙන තරුණ, කාන්තා, ශිෂ්‍ය සහ මධ්‍යම කාරකසභාව විසින් තීරණය කරනු ලබන තවත් එවැනි විෂය ක්ෂේත්‍රයන්ට

අදාලව පිහිටුවන ලබන සංවිධාන මෙනමන් හැඳින්වේ.

### ඇ. වෘත්තිය සංවිධාන

ශ්‍රී ලංකා ප්‍රගතිශීලී යන පූර්ව නාමයෙන් හැඳින්වෙන, වෛද්‍ය, ගුරු, ගොවි, කම්කරු ධීවර ආදී විවිධ වෘත්තිය ක්ෂේත්‍රයන්ට අදාලව මධ්‍යම කාරක සභාව විසින් සම්මතකොට පිහිටුවන ලබන සංවිධාන වෘත්තිය සංවිධාන නමින් හැඳින්වේ.

### ඉ. අනු මණ්ඩල

පවතින දේශපාලන තත්ත්වයන්ට අදාලව පාරිසරික මානව හිමිකම්, සංස්කෘතික, ජාත්‍යන්තර සම්බන්ධතා වැනි ක්ෂේත්‍රයන් සඳහා මධ්‍යම කාරකසභාව විසින් සම්මතකොට පිහිටුවන ලබන සංවිධාන අනු මණ්ඩල නමින් හැඳින්වේ.

## ● 4. වෘත්තිය

### කමිටු

අ. මූලික පක්ෂ ඒකකය කමිටු වේ. එය සෑම ග්‍රාමසේවා වසමකටම හෝ සෑම ඡන්ද මධ්‍යස්ථානයකටම එකක්බැගින් අදාල ප්‍රදේශයේ ශාඛාසංවිධානයේ අධීක්ෂණය යටතේ පිහිටුවනු ලැබේ.

ආ. මෙහි අවම සාමාජිකත්වය හත් දෙනෙකු (07) වන අතර උපරිමය විසි එක් දෙනෙකි. (21)

ඇ. සෑම කමිටුවක්ම සඳහාම ලේකම්වරයෙක් හා ක්‍රියාකාරි කමිටුවක්පත්කර ගතයුතුය.

## ● 5. වගන්තිය

### ශාඛා

අ. ඡන්ද බල ප්‍රදේශයක් (ආසනයක්) නියෝජනය වන පරිදි පිහිටුවන ලබන පක්ෂ සංවිධාන ශාඛාව වේ. ඒවා පක්ෂයේ මධ්‍යම කාරක සභාවට යටත්ව සංවිධාන කටයුතු කරනු ලැබේ. ඒ ඒ ඡන්ද කොට්ඨාශය තුල පක්ෂය ගොඩනැගීමත් පක්ෂයේ මතවාදය ප්‍රචාරය කිරීමත් ශාඛාවල මූලික වගකීමකි.

ආ. ඡන්ද බල ප්‍රදේශයක් තුළ පිහිටුවා ඇති කමිටු සංඛ්‍යාව හතක් (07) සහ සාමාජික සංඛ්‍යාව පනස් එකක් (51) ඉක්මවන අවස්ථාවන් හිදී ශාඛා සංවිධානයක් පිහිටුවීමට හැකිවන්නේය.

ඇ. ශාඛා සභාපති, ශාඛා ලේකම් හා ශාඛා භාණ්ඩාගාරික ඇතුළු අට දෙනෙකු (08) ගෙන් යුත් ක්‍රියාකාරි කමිටුවක් ශාඛා සංවිධානයකට පත් කරගත හැකිවේ.

## ● 6. වගන්තිය

### දිසා කමිටු

අ. පක්ෂයේ ප්‍රචාරක සහ සංවිධාන කටයුතු විධිමත් කිරීමේ අරමුණින් සෑම දිස්ත්‍රික් බල ප්‍රදේශයක් සඳහාම දිසා කමිටු පිහිටුවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

ආ. දිසා ලේකම්වරයාත් දිසා කමිටුවක සාමාජික සංඛ්‍යාවත් ඔවුනගේ වගකීම පිළිබඳවත් මධ්‍යම කාරක සභාවෙන් තීරණය වේ.

## 7. වගන්තිය

### කලාපීය සංවිධාන

අ. පක්ෂයේ ප්‍රචාරක සහ සංවිධාන කටයුතු මෙහෙයවීමේ සහ සම්බන්ධීකරණයේ පහසුව සඳහා දිසාකමටු බල ප්‍රදේශ කිහිපයක් එක්කොට කලාපීය සංවිධාන පිහිටුවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

ආ. කලාපීය ලේකම්වරයාත් කලාපීය සංවිධානයක සාමාජික සංඛ්‍යාවත් ඔවුන්ගේ වගකීම් පිළිබඳවත් මධ්‍යම කාරක සභාවෙන් තීරණය වේ.

## 8. වගන්තිය

### මධ්‍යම කාරක සභාව

අ. පක්ෂ ව්‍යවස්ථාව ක්‍රියාවට නැගීමත් සම්මේලනයේදී ජාතික නියෝජිත සභාවේ මධ්‍යම කාරක සභා රැස්වීම් වලදී හා දේශපාලන මණ්ඩලයේදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමත් මධ්‍යම කාරක සභාවේ වගකීම වේ.

ආ. මධ්‍යම කාරක සභාව පහත සඳහන් විසිපස් දෙනාගෙන් (25) ස්ථාපිත වේ.

I. මහා සම්මේලනයේදී නිළධාරී මණ්ඩලයට තෝරාපත් කරගත් සභාපති ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපතිවරුන් සත්දෙනා (07) හා උප ලේකම් පස්දෙනා (05) නිල බලයෙන් (මින් එක් උපලේකම්වරයෙකු මුලස්ථාන ලේකම් වියයුතුය.)

II. නිලධාරී මණ්ඩලය නියෝජනය නොවන අනු බද්ධ හා වෘත්තිය සංවිධාන වලින්ද, අනුමණ්ඩල වලින්ද සභාපතිවරයා විසින් නම් කරණ ලද දහයක (10) උපරිමයකට යටත් නියෝජිත සංඛ්‍යාවක්

(ඇ) කිසියම් අවස්ථාවකදී නිළධාරී මණ්ඩලයේ හෝ මධ්‍යම කාරක සභාවේ ඇතිවන පුරප්පාඩුවලට සුදුසු පුද්ගලයන් තෝරා පත්කර ගැනීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

(ඈ) ව්‍යවස්ථා සංශෝධන, පක්ෂ අරමුණු, ප්‍රතිපත්ති හා වැඩපිළිවෙලෙහි කිසියම් සංශෝධන වෙතොත් ඒවා කෙටුම්පත් කොට සම්මේලනය වෙත ඉදිරිපත් කිරීමට මධ්‍යමකාරක සභාවට බලය ඇත්තේය.

(ඉ) ඕනෑම විශේෂ අවස්ථාවක හෝ හදිසි අවස්ථාවක මධ්‍යම කාරකසභාවක් කැඳවීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

## 9 වගන්තිය

### දේශපාලන මණ්ඩලය

අ. පක්ෂය සම්බන්ධ උපරිම බලතල හොබවන්නේ දේශපාලන මණ්ඩලයයි. දේශපාලන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ආ. දේශපාලන මණ්ඩලය පහත සඳහන් පරිදි සාමාජිකයින් සත්දෙනෙකුගෙන් (07) සමන්විත වේ.

i. සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික, නිලබලයෙන්

ii. සභාපතිවරයාගේ නිර්දේශය පරිදි මධ්‍යම කාරක සභාවෙන් පත්කරනු ලබන මධ්‍යම කාරකසභිකයින් සිව් දෙනෙක්. (04)

iii. දේශපාලන මණ්ඩලය සඳහා 9 ආ ii. අනුව පත්කරනු ලබන සිව් (04)

දෙනාට අමතරව මධ්‍යම කාරක සභිකයන් අතරින් තවත් විකල්ප මාණ්ඩලිකයන් දෙදෙනෙක් (02) සභාපතිවරයාගේ නිර්දේශය පරිදි මධ්‍යම කාරක සභාවෙන් පත්කළ හැකිය.

iv. දේශපාලන මණ්ඩලය සභාපති ඇතුළු සත් දෙනෙකුගේ (07) ගණපූරණය සහිතව රැස්විය යුතුය.

ඈ. වෙනත් පක්ෂ හා සංවිධාන සමග පක්ෂය වෙනුවෙන් සාකච්ඡා කිරීමටත් සම්මුති ඇති කරගැනීමටත් බලය ඇත්තේ දේශපාලන මණ්ඩලයටය.

ඈ. i. මැතිවරණ වලට තරග වැදීමට අපේක්ෂකයන් තේරීමේත්, නාමයෝජනා දීමේත්, එසේ නාම යෝජනා ලැබූ අයට විධානයක් දීමේත්, වගකීම් පැවරීමේදීත්, ඔවුන් ඉවත් කිරීමේත්, බලය ඇතුළුව, මෙම පක්ෂය සන්ධානගතව සිටින වෙනත් දේශපාලන පක්ෂ වල නියෝජිතයන්ට මෙම පක්ෂයේ අනුමත මැතිවරණ සළකුණින් තරග කිරීමට ඉඩදීමේත්, මෙම පක්ෂය සන්ධානගතව සිටින පිළිගත් දේශපාලන පක්ෂයක අනුමත මැතිවරණ සළකුණින් මැතිවරණ තරගවලට ඉදිරිපත් වීමට මෙම පක්ෂයේ නියෝජිතයන්ට ඉඩදීමේත් බලය, දේශපාලන මංඩලයට පැවරෙන්නේය.

ii. සන්ධාන පිළිබඳ සියළු ලිඛිත සම්මුති දේශපාලන මණ්ඩලයේ තීරණයකට අනුව නීතිඥවරයෙකු ඉදිරියේ අදළ පාර්ශවයන්හි සභාපති ලේකම්වරු විසින් අත්සන් කළයුතු වන්නේය.

ඉ. පක්ෂයේ විනය කටයුතු පිළිබඳවත් සාමාජිකත්වය අවසන් කිරීම හෝ විශ්වාසභංග යෝජනාවක් සම්මත වීම හෝ වෙනත් හේතු මත පක්ෂයෙන් නෙරපා හැරීම පිළිබඳවත් පක්ෂය සතු සියළු නිශ්චල හා චංචල දේපොල පිළිබඳවත් පක්ෂයේ ගිණුම් කටයුතු පාලනය පිළිබඳවත් පූර්ණ වගකීම හා බලය දේශපාලන මංඩලය සතුවන්නේය.

ඊ. දේශපාලන මණ්ඩලයේ තීරණය සාමුහික වන්නේය.

උ. දේශපාලන මණ්ඩලය සභාපතිවරයා විසින් කැඳවිය යුතු වන්නේය.

## ● 10 වගන්තිය

### ජාතික නියෝජිත සභාව

අ. පක්ෂයේ ප්‍රගතිය, පක්ෂ සංවිධාන, මැතිවරණ කටයුතු පක්ෂයේ ආරක්ෂාව හා සාමාජිකයන්ගේ විනයානුකූල කටයුතු පිළිබඳ ජාතික මට්ටමේ විමර්ශනයන් කිරීමටත්, ඒවා සාකච්ඡාකොට අවශ්‍ය වාර්තා හා නිර්දේශ මධ්‍යම කාරක සභාව හෝ දේශපාලන මංඩලය වෙත යොමු කිරීමටත් තෙමසකට වරක් ජාතික නියෝජිත සභාව රැස්විය යුතු වන්නේය.

ඇ. කිසියම් විශේෂ අවස්ථාවක මධ්‍යම කාරක සභා තීරණයක් පරිදි විශේෂ ජාතික නියෝජිත සභා පැවැත්විය හැකිවන්නේය.

ඈ. මධ්‍යම කාරක සභිකයන්, දිස්ත්‍රික් සංවිධායකයන්, අනුබද්ධ සංවිධානවල සභාපති හා ලේකම්වරුන්, වෘත්තීය සංවිධාන වෙනුවෙන් මධ්‍යම කාරක සභාව විසින් නම් කරන නියෝජිතයෙකු අනුමංඩල වෙනුවෙන් මධ්‍යමකාරක සභාව නම් කරන සිව් දෙනෙකු (04) හා සභාපති විසින් නම් කරන දස දෙනෙකු (10) ගෙන් ජාතික නියෝජිත සභාව නියෝජනය වන්නේය.

## ●11 වගන්තිය

### මහා සම්මේලනය

අ. සෑම සංවත්සරයක් සඳහාම මහා සම්මේලනයක් පවත්වනු ලබන්නේය. මහා සම්මේලනයක් පැවැත්වීමට යටත් පිරිසෙයින් තුන් (03) මාසයකට පෙර දේශපාලන මංඩලයෙන් තීරණයක් ගෙන සභාපති හා ලේකම් විසින් දිනය ස්ථානය හා වේලාව මැතිවරණ කොමසාරිස්වරයාට හා දිස්ත්‍රික් සංවිධායකවරුන් මගින් අදාළ සාමාජිකයන්ට දැනුම්දිය යුතු වන්නේය.

ආ. මධ්‍යම කාරක සභාව විසින් කිසියම් තීරණාත්මක මොහොතකදී විශේෂ සම්මේලනයක් වහා කැඳවිය යුතුයයි තීරණය කළ අවස්ථාවක ඉහත සඳහන් පරිදි අදල අයට දැනුම්දිය යුතු යුතු අතර සති තුනක් (03) ඇතුළත විශේෂ සම්මේලනය කැඳවිය යුතු වන්නේය.

ඇ. සම්මේලනයට ඉදිරිපත් කළයුතු න්‍යාය පත්‍රය යෝජනා වාර්තා, අයවැය වෙනත් ලියවිලි හා ව්‍යවස්ථා, සංශෝධන, කෙටුම්පත්ද සම්මේලනයට කලින් පවත්වන මධ්‍යම කාරක සභාවෙන් අනුමත කළයුතු වන්නේය.

ඈ. සම්මේලනයේදී පක්ෂ ව්‍යවස්ථාවේ 8 වන වගන්තියේ (ආ) ඡේදය අනුව නිළධාරී මණ්ඩලය පත්කර ගතයුතු වන්නේය. නිළධාරී මණ්ඩලය මැතිවරණ කොමසාරිස්වරයා වෙත සතියක් ඇතුළත දැනුම් දිය යුතු වන්නේය.

ඉ. සම්මේලනය සඳහා ඒ වනවිට මධ්‍යමකාරක සභාව නියෝජනය කළ සභිකයන්ද ලියාපදිංචි වූ ශාඛාවකින් නම්කරන දෙදෙනකු (02) ලියාපදිංචි වූ අනුබද්ධ හා වෘත්තීය සංවිධානවලින්ද ලියාපදිංචි වූ අනුමණ්ඩලවලින්ද නම්කෙරෙන දසදෙනා (10) බැගින්ද සභාපති විසින් නම් කෙරෙන තවත් විසිදෙනෙකුද (20) සහභාගී විය යුතුය. ශාඛා හෝ අනිකුත් සංවිධාන පිහිටුවා නොතිබීම සම්මේලනය පැවැත්වීමට බාධාවක් නොවන්නේය.

## ● 12. වගන්තිය

I. සාමාජිකත්වය ලබාගැනීම

අ. පක්ෂයේ ප්‍රතිපත්ති අරමුණු හා ව්‍යවස්ථාව පිළිගන්නා වයස අවුරුදු දහත (17) ඉක්ම වූ ශ්‍රී ලාංකිය කවර පුද්ගලයෙකුට වුවද සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළහැකි වන්නේය.

ආ. වෙනත් දේශපාලන පක්ෂයක හෝ පක්ෂයේ ප්‍රතිපත්ති වලට පටහැනි කිසියම් සංවිධානයකට බැඳී සිටින කිසිවෙකුට හෝ මෙම දේශපාලන පක්ෂයේ සාමාජිකත්වය හිමි නොවන්නේය.

ඈ. පක්ෂ මුලස්ථානයෙන් මුද්‍රාගතකොට නිකුත් කෙරෙන අයදුම්පතක් නිසි පරිදි සම්පූර්ණකොට මධ්‍යම කාරක සභිකයෙකු ලවා නිර්දේශ කරවා අදාල ලිත් වර්ෂයට සාමාජික මුදල වශයෙන් රුපියල් දහයක් (10) බැගින් ගෙවා භාණ්ඩාගාරික වෙතින් නිකුත් කෙරෙන රිසිට් පත ලබා වර්ෂයක අධීක්ෂණ කාලයකින් පසුව ස්ථිර සාමාජිකත්වය පිරිනැමීමට සුදුස්සෙකු වන්නේය.

ඇ. සියළු සාමාජිකයන් ශපථ කිරීමකින් පසු පක්ෂ සාමාජික හදුනුම්පත ලබාගත් බවට ස්ථිර සාමාජික නාම ලේඛණයේ අත්සන් තැබිය යුතු වන්නේය.

ඉ. සාමාජික හැදුනුම්පත පක්ෂය සතු වුවකි. වලංගු කාලයෙන් පසු පක්ෂයේ අදළ බලධාරීන් වෙත භාරදී අළුත් කරගැනීම හෝ අළුත් කාඩ්පතක් ලබාගැනීම හෝ කළ යතු වන්නේය.

II සාමාජිකත්වය අවසන්වීම

පහත සඳහන් හේතු එකක් හෝ කිහිපයක් මත සාමාජිකත්වය අවසන් වන්නේය

අ. යම් සාමාජිකයකු විසින් පක්ෂයේ සභාපති හෝ ලේකම්වෙත ඉල්ලා අස්වීමේ ලිපියක් එවීමෙන්

ආ. පිටපිට වර්ෂ දෙකක් සාමාජික මුදල් නොගෙවා සිටීමෙන්

ඇ. වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලබාගැනීමෙන්.

ඇ. විනය පරික්ෂණයකදී චෝදනාවකට හෝ කිහිපයකට වරදකරුබව ඔප්පුවීමෙන්.

ඉ. නෙරපාහැරීමෙන්.

III සාමාජිකත්වය තහනම් කිරීම

යම් සාමාජිකයෙකුගේ ක්‍රියා කලාපය පක්ෂ විනයට හා පක්ෂයේ කීර්තිනාමය පළුදුවන ආකාරයෙන් හෝ පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝණය වන පරිද්දෙන් සිදුවන බවට මධ්‍යම කාරකසභාව වෙත ලිඛිතව දැනුම්දීමක් ලැබුන අවස්ථාවක එම සාමාජිකයා නිසා පක්ෂයේ ව්‍යවස්ථානුකූල පැවැත්මට බරපතල හානියක් වෙතැයි මධ්‍යම කාරක සභාව විසින් නිසි විමසීමකින් පසු තීරණය කළහොත් ඔහුගේ හෝ ඇයගේ පක්ෂ සාමාජිකත්වය තහනම් කිරීමට පක්ෂයේ සභාපතිවරයාට බලය ඇති අතර ඒ බව දින දහහතරක් (14) ඇතුලත චූදිත පුද්ගලයා වෙත ලියාපදිංචි තැපැලෙන් දැනුම් දී මධ්‍යම කාරක සභාවට වාර්තා කළ යුතු වන්න්ය.

IV විනය පරීක්ෂණය

අ. යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය තහනම් කොට දින දහහතරක් (14) ඇතුලත මධ්‍යමකාරක සභාව විසින් එකී චූදිත පුද්ගලයාට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන් විනය පරික්ෂණයක් පැවැත්වීම සඳහා විනය කමිටුවක් හා විනය කමිටු ලේකම්වරයෙක් ද පත්කළ යුතුවන්නේය.

ආ. මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි විනය කමිටුවේ ලේකම්වරයා විසින් සාමාජිකත්වය තහනම් වී දින දහහතරක් (14) ඇතුළත චූදිතපුද්ගලයා වෙත ලියාපදිංචි තැපැලෙන් චෝදනා පත්‍රය යැවිය යුතු වන්නේය.

ඇ. විනය පරික්ෂණය පැවැත්වීම පිළිබඳව අවශ්‍ය සියළු විධිවිධාන මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළයුතු අතර විනය පරික්ෂණ

අවසන් වූ පසු ඒ පිළිබඳ නිර්දේශයන් සහිත වාර්තාවක් විනය කමටුව විසින් දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

IV විශ්වාස භංග යෝජනාව

අ. පක්ෂ සාමාජිකත්වය තහනමට ලක්වූ යම් පුද්ගලයෙකුගේ ක්‍රියාකලාපය පක්ෂ විනයට හා පක්ෂයේ කීර්තිනාමය පළුදුවන ආකාරයෙන් හෝ පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය වන පරිද්දෙන් තව දුරටත් සිදුවෙන බවට, ජාතික නියෝජිත සභාව නියෝජනය කරන යම් සාමාජිකයෙකු විසින් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත්කළ යුතු යයි මධ්‍යම කාරක සභාවට ලිඛිත ඉල්ලීමක් කළහොත් ඒ පිළිබඳ නිසි විමසීමකින් පසු ජාතික නියෝජිත සභාව රැස්කරවා එකී විශ්වාස භංග යෝජනාව විමසීමට ජාතික නියෝජිත සභාවට බලය හිමි වන්නේය.

ආ. එසේ විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමට මධ්‍යම කාරක සභාව විසින් අනුමැතිය දුන් දින සිට දින දාහතරක් (14) ඇතුළත එම යෝජනාවේ පිටපතක්ද යෝජනාව විමසීමට ජාතික නියෝජිත සභාව රැස්වන දිනය ස්ථානය හා වේලාව සඳහන් දැන්වීමක්ද චූදිත පුද්ගලයාවෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු වන්නේය.

ඇ. විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන සාමාජිකයා ඒ පිළිබඳ ඡන්ද විමසීමකදී ඡන්දය දීමෙන් වැලකී සිටිය යුතු අතර එකී විශ්වාස භංග යෝජනාව ජාතික නියෝජිත සභාවේ වැඩි ඡන්දයෙන් සම්මත වුවහොත් ඒ පිළිබඳ නිර්දේශයන් සහිත වාර්තාවන් දේශපාලන මංඩලය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

## ●13 වගන්තිය

සුබ පතන්නන්

ක්‍රියාකාරී ප්‍රසිද්ධ දේශපාලනයට එතරම් කැමැත්තක් නොදැක්වුවත් මෙම දේශපාලන පක්ෂයේ අරමුණු, ප්‍රතිපත්ති වැඩ පිළිවෙල හා සේවාවන් ගැන පැහැදී සහාය දක්වනු කැමති පුද්ගලයන්ට පක්ෂයේ සුබපතන්නන් වශයෙන් දායක විය හැකිය. ඒ වෙනුවෙන් රුපියල් දෙකක (02) වාර්ෂික දායක මුදලක් ගෙවා සුබපැතීමේ දායක සහතිකයක් ලබාගත යුතුය. සුබ පතන්නෙකුට අවශ්‍ය නම් නියමිත පරිදි පක්ෂ සාමාජිකත්වය අයදුම්කල හැකිවන්නේය.

## ●14. අන්තර් විධිවිධාන

බලතල

අ. සභාපතිවරයා පක්ෂ නායකයාය. නිල බලයෙන්ම පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාද වන්නේය.

ආ. පක්ෂය සම්බන්ධ සියළු ලිපිලේඛණ පක්ෂයේ සියළු චංචල හා නිශ්චල දේපල පිළිබඳ නීත්‍යානුකූල භාරකාරත්වය සභාපතිවරයා වෙත පැවරේ.

ඇ. සභාපතිවරයාගේ, මධ්‍යම කාරක සභාවේ, හා දේශපාලන මංඩලයේ තීරණ හා උපදෙස් පරිද පැමිණීමේ ලේඛණ සියළු වාර්තා හා ලියවිලි නිසි පරිදි සැකසීමක් ඉදිරිපත් කිරීමත් ඒවා නිසි පිළිවෙලට පරිහරණය කිරීමත් ඒ සියල්ල පක්ෂ මූලස්ථානයේ ආරක්ෂා සහිතව ගොනුකර තැබීමත් ලේකම්වරයා වෙත පැවරේ. ලේකම්වරයාට පැමිණිය නොහැකි අවස්ථාවක මෙම කටයුතු මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි උප ලේකම්වරයෙකුට පැවරිය හැකි

වන්නේය.

ඇ. පක්ෂය වෙනුවෙන් නිකුත් කරන සෑම ලිපියක් හා ප්‍රකාශයක්ම සභාපතිවරයාගේ අත්සන සහිතව නිකුත් විය යුතු අතර නොඑසේ නම් එහි කිසිදු නීත්‍යානුකූලභාවයක් හෝ වලංගුභාවයක් නොවන්නේය.

ඉ. පක්ෂයේ කවර පුද්ගලයෙකුට වුවද වගකීමක් පැවරීමේදී සභාපති අත්සන සහිතව ලිපියකින් ඒ බව දැන්විය යුතු වන්නේය.

## ●15 වගන්තිය

විශේෂ විධිවිධාන

අ. පක්ෂයේ සියළු සංවිධාන වලට අයත් සියළු සාමාජිකයන් පක්ෂ ව්‍යවස්ථාවට පක්ෂපාතී ව අදල සංවිධාන වල තීරණ වලට එකගව ඒවා පිළිපැදීමටත් ක්‍රියාත්මක කිරීමටත්, තනි තනිව, හා සාමූහිකව බැඳී සිටින්නේය.

ආ. මෙම ව්‍යවස්ථාව පිළිබඳ කිසියම් ගැටළුවක් මතුවූ විටක එය පැහැදිලි කිරීමේත් ඒ පිළිබඳ අර්ථකථන දැක්වීමේත් අවසාන තීරණය දීමේත් බලය දේශපාලන මංඩලය සතු වන්නේය.

ඇ. මෙම ව්‍යවස්ථාවේ දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පරිවර්තන නිසා එකී පාඨ අතර යම් ව්‍යාකූලතාවයන් මතු වුවහොත් එවැනි විටෙක වලංගු වන්නේ සිංහල භාෂාවෙන් සැකසුන මෙම ව්‍යවස්ථාව මිස එහි දෙමළ හෝ ඉංග්‍රීසි පරිවර්තන නොවන්නේය.

ඉ. දේශපාලන මණ්ඩලය හැර අන් සියළු සංවිධාන වල ගණපූරණය නියමිත නියෝජිත සංඛ්‍යාවෙන් තුනෙන් එකක් (1/3) වන්නේය.

## ● 16. වගන්තිය

අන්තර් විධිවිධාන

අ. මෙම ව්‍යවස්ථාව සම්මත වනවාත් සමගම, එසේ සම්මත වූ 1997 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සම්මේලනයෙන් තෝරා පත්කර ගත් නිළධාරී මණ්ඩලය සහිත මධ්‍යම කාරක සභාවත් එම මධ්‍යම කාරක සභාව තුළින් ප්‍රතිෂ්ඨාපිත දේශපාලන මණ්ඩලයත් නීත්‍යානුකූල ලෙස වලංගු වන්නේය. මෙම ව්‍යවස්ථාව සම්මත වනවාත් සමගම මින් පෙර පනවා තිබුණ සියළු ව්‍යවස්ථා පරිච්ඡින්න වන්නේය.

ආ. මෙම ව්‍යවස්ථාව සම්මත වීමෙන්අනතුරුව සභාපති විසින් සංවිධාන ගොඩනැංවීම සඳහා දිස්ත්‍රික් සංවිධායකවරුන් පත් කළ යුතු අතර ඔවුන් විසින් මාස හයක් (06) ඇතුළත ප්‍රධාන සංවිධාන 1 සිට 4 දක්වා සහ අනුබද්ධ, වෘත්තිය සංවිධාන හා අනුමංඩල වලින් අවම වශයෙන් එකකට (01) වැඩියෙන් පිහිටුවා පක්ෂ කාර්යාලයේ ලියා පදිංචි කළයුතු වන්නේය.

ඇ. අනුබද්ධ හා වෘත්තිය සංවිධාන හා අනුමංඩල වලට අයත් අතුරු ව්‍යවස්ථා මධ්‍යමකාරක සභාව විසින් සකස්කොට දේශපාලන මණ්ඩලයෙන් අනුමත කළ යුතුවන්නේය.

ඈ. පක්ෂයේ වලංගු ව්‍යවස්ථා පිටපත් සභාපති හා ලේකම්ගේ අත්සන් යොද නිලමුද්‍රාව තබා සහතික කළයුතු අතර ව්‍යවස්ථාවේ පිටකවරය සභාපති රතු මුද්‍රාවෙන් වලංගු කළයුතු වන්නේය.

**සිද්ධරස්තු**

පිටු අංක 1 සිට 19 දක්වා ඇති වගන්ති 1 සිට 16 දක්වා වූ සම්පූර්ණ ව්‍යවස්ථාව සහතික කරමු.

සභාපති අත්සන

ආරිය බුලේගොඩ
සභාපති
ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණ

ලේකම් අත්සන

[illegible]
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණ